PRODUCTION COST & MARKET STRUCTURES (Part-VI)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

සාධක වෙළෙඳපොළ

භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය වැනි නිෂ්පාදන සාධක විකිණීමත්, මිලට ගැනීමත් සිදු කෙරෙන වෙළෙඳපොළ සාධක වෙළෙඳපොළ නමින් හැඳින්වේ.

සාධක මිල තීරණය වීම

භාණ්ඩ වෙළෙඳපොළෙහි භාණ්ඩවලට ඇති ඉල්ලුම හා සැපයුම මත භාණ්ඩ මිල තීරණය වන්නා සේ ම සාධක වෙළෙඳපොළෙහි සාධකවලට ඇති ඉල්ලුම හා සැපයුම මත සාධක මිල තීරණය වේ.

සාධක සේවා විකිණීමට ඉදිරිපත් වන්නේ කුටුම්බ අංශය වන අතර, සාධක සේවා මිලට ගනු ලබන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතන විසිනි.

ClassWork.LK

සාධක ඉල්ලුම

සාධකවලට ඇති ඉල්ලුම රඳා පවත්නේ එම සාධක භාවිත කොට නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම මත ය.

මේ නිසා නිෂ්පාදන සාධක සඳහා ඇති ඉල්ලුම ව්‍යුත්පන්න ඉල්ලුමක් සේ සැලකේ.

නිදසුන් :-

- ඉදි කිරීම් සඳහා ඇති ඉල්ලුම මත පෙදරේරුවන් සඳහා ඉල්ලුමක් ඇති වීම

- ඇඟලුම් සඳහා ඇති ඉල්ලුම මත ඒවා නිපදවන ශ්‍රමිකයන්ට ඉල්ලුමක් ඇති වීම

- පරිගණකවලට ඇති ඉල්ලුම මත පරිගණක මෘදුකාංග ශිල්පීන්ට ඉල්ලුමක් ඇති වීම

- කෘෂිභෝගවලට ඇති ඉල්ලුම මත භූමියට ඉල්ලුමක් ඇති වීම

ClassWork.LK

නිෂ්පාදන ආයතන සාධක සඳහා ඉල්ලුම් කරනුයේ සාධක මිල (වැටුප්, බදු කුලී, පොළී, ලාභ) සැලකිල්ලට ගැනීමෙනි.

සාධක මිල වැඩි නම් සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු වන අතර සාධක මිල අඩු නම් සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි වේ.
මෙම නිසා සාධක මිල හා සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අතර ප්‍රතිලෝම සමබන්ධයක් පවතී.

නිදසුන් :-

ශ්‍රමිකයකුගේ වැටුප් ඉහළ යත් ම ශ්‍රම ඉල්ලුම අඩු වන අතර, වැටුප් පහළ යන විට ශ්‍රම ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ.

ClassWork.LK

සාධක ඉල්ලුම් වක්‍රය

සාධක සඳහා වන ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.

නිදසුන් :-

ශ්‍රම ඉල්ලුම් වක්‍රය පහත පරිදි වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.



ClassWork.LK

<u>සාධක සැපයුම</u>

සාධක හිමියන් සාධක සපයනු ලබන්නේ ද සාධක මිල සැලකිල්ලට ගැනීමෙනි.

සාධක මිල වැඩි වන විට සාධක සැපයුම වැඩි වන අතර, සාධක මිල අඩු වන විට සාදක සැපයුම අඩු කරයි. මෙම නිසා සාධක මිල හා සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අතර අනුලෝම සමබන්ධයක් පවතී.

නිදසුන් :

වැටුප් වැඩි වත් ම ශ්‍රමිකයන් වැඩියෙන් ශ්‍රමය සැපයීමට කැමැත්තක් දක්වන අතර වැටුප් අඩු වත් ම ශ්‍රම සැපයුම අඩු කිරීමට පෙලඹෙති.

ClassWork.LK

සාධක සැපයුම වක්‍රය

මේ නිසා සාධක සඳහා වන සැපයුම වක්‍රය වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ.



ClassWork.LK

සාධකවල සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය තීරණය වීම

මේ අනුව සාධක ඉල්ලුම් වක්‍රය හා සාධක සැපයුම් වක්‍රයෙහි අනෝන්‍ය ක්‍රියාකාරිත්වය මත සාධක මිල සහ සමතුලිත ප්‍රමාණය තීරණය වේ.



ඉහත රූප සටහනට අනුව a ලක්ෂ්‍යයේ දී ශ්‍රම වෙළෙඳපොළ සමතුලිත අවස්ථාව වන අතර එහි දී සමතුලිත වැටුප් අනුපාතිකය W_1 වේ.

ClassWork.LK

(ශ්‍රම වෙළෙඳපොළේ ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම මත ශ්‍රමයේ මිල තීරණය වන්නා සේ ම , අනෙකුත් සාධකවල ද ඉල්ලුම හා සැපයුම මත ඒවාහි ද මිල ගණන් තීරණය වේ.)

ClassWork.LK

සංක්‍රාම ඉපැයීම

කිසියම් සාධක සේවාවක මිල මගින් පෙන්නුම් කෙරෙනුයේ එම සාධකයේ ඉපැයීම යි.

කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා එම සාධකය අපේක්ෂා කරන අවම මිල එම සාධකයේ සංක්‍රාම ඉපැයීම ලෙස හැඳින්වේ.

(යම් සාධකයක් සේවා නියුක්ත කරවීම සඳහා ගෙවිය යුතු අවමය සංක්‍රාම ඉපයීම් වේ.)

සාධකයකට එම අවම ප්‍රමාණයවත් ලබා ගත නොහැකි නම් එම සාධකය තව දුරටත් එම කාර්යයේ නිරත නොවී එම ඉපයීම් ලබා ගත හැකි වෙනත් භාවිතයක් කරා ඉවත් වී යාමට පුළුවන.

මේ නිසා එක් නිෂ්පාදන කාර්යයක සිට තවත් නිෂ්පාදන කාර්යයකට සම්පත් මාරු වීම වැළැක්වීම සඳහා සාධකයකට අවශ්‍ය අවම ඉපැයුම සංක්‍රාම ඉපැයුම් මගින් පිළිබිඹු කෙරේ.

එහෙයින් සාධකයක වර්තමාන භාවිතයේ ආවස්ථික පිරිවැය සංක්‍රාම ඉපැයුම් මගින් පෙන්නුම් කරයි.

ClassWork.LK

කිසියම් සාධකයක පවත්නා භාවිතයෙහි රඳවා ගත හැක්කේ එම ආවස්ථික පිරිවැය පියවීමට ප්‍රමාණවත් ආදායමක් ලැබේ නම් පමණි.

ClassWork.LK

ආර්ථික බදු කුලිය

කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා ගැනීම සඳහා අපේක්ෂා කරන අවම ගෙවීම ඉක්මවා ආදායමක් උපයා ගන්නේ නම් එම අතිරික්ත ආදායම ආර්ථික බදු කුලිය ලෙෂ හඳුන්වනු ලැබේ.

එනම් යම් සාධකයක වර්තමාන ඉපයුම සංක්‍රාම ගෙවීම් ඉක්මවා යන්නේ නම් ඒ ඉක්මවා යන ප්‍රමාණය ආර්ථික බදු කුලියෙන් පෙන්නුම් කෙරේ.

නිදසුන

කිසියම් පුද්ගලයකුට වර්තමාන සේවා නියුක්තිය මගින් දිනකට රුපියල් 1000ක් ද, ඊළඟට කළ හැකි රැකියාව තුළින් දිනකට රුපියල් 800ක්ද ඉපයීමට හැකි බව සිතමු.

මේ අනුව ඔහුගේ,

සංක්‍රාම ඉපයීම් = රුපියල් 800

ආර්ථික බදු කුලිය = රුපියල් 200

ClassWork.LK

ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් ප්‍රස්තාර සටහනක් මගින්



සාධක සැපයුම් වක්‍රයෙන් එම සාධකයේ ඒ ඒ ඒකකය සැපයීම සඳහා සැපයුම්කරුවා බලාපොරොත්තු වන අවම මිල එනම් ආවස්ථික පිරිවැය පෙන්නුම් කෙරේ.

රූප සටහනට අනුව සාධකයෙහි සමතුලිත මිල P_3 හා සමතුලිත ප්‍රමාණය Q_3 වේ.

ClassWork.LK

OP_3EQ_3 සෘජුකෝණාස්‍රයේ කේෂ්ත්‍රඵලයෙන් Q_3 ප්‍රමාණය සේවා නියුක්ත වන විට සාධකය සඳහා ලැබෙන මුළු ඉපැයීම් ප්‍රමාණය පෙන්නුම් කෙරේ.

මෙ මුළු ඉපැයුම් ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් යන සංරචක දෙකකින් සමන්විත ය.

ඒ අනුව OP_3E ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය Q_3 ප්‍රමාණය සේවා නියුක්ත කිරීමෙන් ලැබෙන ආර්ථික බදු කුලිය ද OEQ_3 ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය Q_3 සේවා නියුක්තිය කිරීමෙන් ලැබෙන සංක්‍රාම ඉපැයුම් ද වේ.

තව දුරටත් සාධකයේ මුළු ඉපැයුම් ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් ලෙස කොටස් වි යන ආකාරය පහත පරිදි හඳුනාගත හැකි ය.

<u>**රූප සටහන අනුව,**</u>

Q_1 සේවා නියුක්ත කරවීම සඳහා සාධක හිමියන්ට ගෙවිය යුතු අවම මිල එනම් සංක්‍රාම ඉපැයුම P_1 වේ. එහෙත් Q_1 සේවා නියුක්ත කරන විට එම සාධකයේ වෙළෙඳපොළ මිල P_3 වේ.මේ නිසා P_3 - P_1 අතර වෙනස ආර්ථික බදු කුලිය වේ.

ClassWork.LK

මේ ආකාරයෙන් ම Q_2 සේවා නියුක්ත කරන විට සංක්‍රාම ඉපැයුම් P_2 වේ. $P_3 - P_2$ අතර වෙනස ආර්ථික බදු කුලිය වේ.

Q_3 සේවා නියුක්ත කරන විට ගෙවිය යුතු අවම මිල P_3 වේ. එය සාධකයේ වෙළෙඳපොළ මිලට සමාන හෙයින් එහි දී මුළු ඉපැයුම සංක්‍රාම ඉපැයුම් වේ.

ClassWork.LK

<u>සාධක සැපයුම් නම්‍යතාව විවිධ වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම්හි ඇතිවන වෙනස්කම්</u>

සාධක සැපයුම් නම්‍යතාව විවිධ වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම්හි ද වෙනස්කම් ඇතිවේ.

පහත දැක්වෙන්නේ විවිධ සාධක සැපයුම් නම්‍යතා අවස්ථාවල දී ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් හැසිරෙන ආකාරය යි.

ClassWork.LK

ඒකීය නම්‍ය සාධක සැපයුම් අවස්ථාවක සාධක ඉපැයුම්

සාධක සැපයුම ඒකීය නම්‍ය වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් එකිනෙකට සමාන වේ.

පහත රූප සටහනෙන් දැක්වෙන්නේ එම තත්ත්වය යි.



ඉහත රූප සටහනේ $0P_1EQ_1$ සෘජුකෝණයේ ක්ෂේත්‍රඵලය සාධකයේ මුළු ඉපැයුම් වේ.

මුළු ඉපැයුම්වලින් $0P_1E$ ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය ආර්ථික බදු කුලිය ද , $0EQ_1$ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය සංක්‍රාම ඉපැයුම් ද වේ.

ClassWork.LK

$0P_1E$ සහ $0E$ Q_1ත්‍රිකෝණ දෙකෙහි ක්ෂේත්‍රඵලය එකිනෙකට සමාන වන අතර එයින් පිළිබිඹු වන්නේ ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් එකිනෙකට සමාන වන බව යි.

ClassWork.LK

<u>පූර්ණ අනම්‍ය සාධක සැපයුම් අවස්ථාවක සාධක ඉපැයුම්</u>

සාධක සැපයුම පූර්ණ අනම්‍ය වන විට මුළු සාධක ඉපැයුම් ආර්ථික බදු කුලියෙන් සමන්විත වේ.

පහත රූප සටහනින් පෙන්නුම් කෙරෙන්නේ එබඳු තත්ත්වයකි.



ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාවේ දී සාධකයේ මිල ශූන්‍ය වුව ද එම සාධකයේ සැපයුම් ප්‍රමාණය Q_1 වේ.

වෙළෙඳපොළ සාධක ඉල්ලුම හා සැපයුම මගින් තීරණය වූ මිල P_1 වේ. එවිට මුළු ඉපැයුම් $0P_1EQ_1$ ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන අතර එම මුළු ඉපැයුම ම ආර්ථික බදු කුලියක් වේ.

ClassWork.LK

සාධකයේ ඉපැයුම මුළුමනින් ම ආර්ථික බදු කුලියක් වීමට හේතුව වන්නේ පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාවේ දී Q_1 ප්‍රමාණයක් සේවා නියුක්ත කිරීම සඳහා ගෙවිය යුතු මිල ශුන්‍ය වීම යි.

ClassWork.LK

පූර්ණ නම්‍ය සාධක සැපයුම් අවස්ථාවක දී සාධක ඉපැයුම්

සාධකයේ සැපයුම පූර්ණ නම්‍ය වන විට මුළු ඉපැයුම් සංක්‍රාම ඉපැයුම් වේ.

පහත රූප සටහනින් එම තත්ත්වය පෙන්නුම් කෙරේ.



සාධක සැපයුම පූර්ණ නම්‍ය වන විට P_1 මිලට ඕනෑ ම සාධක ප්‍රමාණයක් සැපයීමට සාධක හිමියෝ කැමැත්තක් දක්වති.

ClassWork.LK

මේ නිසා $0P_1EQ_1$ ඍජුකෝණයේ ක්ෂේත්‍රඵලය මුළුමනින්ම සංක්‍රාම ඉපැයුම් වේ.

(**නිදසුන්** - භූමි සාධකය සැලකිල්ලට ගත හොත් එක් වගාවකින් වෙනත් වගාවකට මාරු විය හැකි වීම)

ClassWork.LK

අනම්‍ය සාධක සැපයුම් අවස්ථාවක දී සාධක ඉපැයුම් :-

අනම්‍ය සාධක සැපයුමක් පවතින විට මුළු ඉපැයුම්වලින් වැඩි කොටසක් ආර්ථික බදු කුලියෙන් ද , අඩු කොටසක් සංක්‍රාම ඉපැයුම් වේ.

පහත රූප සටහනෙන් එම තත්ත්වය පෙන්නුම් කෙරේ.



ClassWork.LK

රූප සටහනට අනුව $0P_1EQ_1$ සෘජුකෝණය මුළු සාධක ඉපැයුම් පෙන්නුම් කරන අතර එයින් $0P_1EQ$ ප්‍රදේශයෙන් ආර්ථික බදු කුලියක් QEQ_1 ප්‍රදේශයෙන් සංක්‍රාම ඉපැයුමක් පෙන්නුම් කරයි.

මෙහි දී $0P_1EQ$ ක්ෂේත්‍රඵලය QEQ_1 ක්ෂේත්‍රඵලයට වඩා වැඩි වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ අනම්‍ය සාධක සැපයුමක දී ආර්ථික බදු කුලිය සංක්‍රාම ඉපැයුම්වලට වඩා වැඩි බව යි.

ClassWork.LK

නම්‍ය සාධක සැපයුම් අවස්ථාවක දී සාධක ඉපැයුම්

සාධක සැපයුම නම්‍ය වන විට වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම් වන අතර අතර අඩු කොටස ආර්ථික බදු කුලිය වේ.

පහත රූප සටහනෙන් පෙන්නුම් කෙරෙන්නේ එවැනි තත්ත්වයකි,



ඉහත රූප සටහනේ $0P_1EQ_1$ සෘජුකෝණයේ ක්ෂේත්‍රඵලය මුළු සාධක ඉපැයුම් වේ.

එයින් NP_1E ක්ෂේත්‍රඵලය ආර්ථික බදු කුලිය වන අතර $0NEQ_1$ ප්‍රදේශය සංක්‍රාම ඉපැයුම් වේ.

ClassWork.LK

මෙහිදී $0NEQ_1$ ක්ෂේත්‍රඵලය NP_1E ක්ෂේත්‍රඵලයට වඩා වැඩි වීමෙන් නම්‍ය සාධක සැපයුමක දී වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම් බව පැහැදිලි වේ.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura